විසර්ජන ශීර්ෂය 269

මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඒ යටතේ වන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ගිණුම් පිලිබඳ විගණකාධිපති වාර්තාව

1. **දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්**

(i) දිළිඳුකම අවම කිරීමේ මූලාරම්භයන් කළමනාකරණය හා ව්‍යාප්ත කිරීම
(ii) ආපදා සහන සහ පුනරුත්ථාපන ව්‍යාපෘති පරිපාලනය කිරීම
(iii) සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම හා පාලනය
(iv) මැතිවරණ කටයුතු සම්බන්ධීකරණය කිරීම
(v) දිස්ත්‍රික් ව්‍යාපෘති පරිපාලනය හා යොමු කිරීම
(vi) විශ්‍රාම වැටුප් ගෙවීම
(vii) උපත් හා මරණ ලියාපදිංචි කිරීම
(viii) ජාතික හැඳුනුම්පත් හා ගමන් බලපත්‍ර ඉල්ලුම්පත් භාර ගැනීම
(ix) ඉඩම් සම්බන්ධ කාර්යයන්
(x) ආදායම් එකතු කිරීම

2. **දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශිය ලේකම් කාර්යාල**

(i) කෝරලෙයිපත්තු උතුර
(ii) කෝරලෙයිපත්තු බටහිර
(iii) කෝරලෙයිපත්තු මධ්‍යම
(iv) කෝරලෙයිපත්තු
(v) කෝරලෙයිපත්තු දකුණ
(vi) එරාවුර්පත්තු
(vii) එරාවුර් නගරය
(viii) මන්මූනෙයි උතුර
(ix) කාත්තන්කුඩි
(x) මන්මුනෙයිපත්තු
(xi) මන්මුනෙයි දකුණ හා ඉරුවිල්පත්තු
(xii) පොරතිවුපත්තු
(xiii) මන්මුනෙයි නිරිත
(xiv) මන්මුනෙයි බටහිර

3. වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම ගිණුම් වර්ෂය ආරම්භයේ පිළියෙල කර තිබුණි.

4. ගිණුම්

4.1 මුළු ප්‍රතිපාදනය හා වියදම

මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ඒ යටතේ වූ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 14 ක් සදහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.296,350,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.277,004,932 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදෙශිය ලේකම් කාර්යාලවල ශුද්ධ ඉතිරි කිරීම් රු.19,345,068 ක වූ අතර, එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 6.53 ක් විය.

වියදමේ ස්වභාවය	ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය	ශුද්ධ ප්‍රතිපාදනය	උපයෝජනය	ඉතිරිය	ඉතිරිය මුළු ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස
	රු.	රු.	රු.	රු.	%
පුනරාවර්තන	260,200,000	260,200,000	254,852,319	5,347,681	2.05
මූලධන	36,150,000	36,150,000	22,152,613	13,997,387	38.72
					6.53
මුළු වියදම	296,350,000	296,350,000	277,004,932	19,345,068	

4.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

විවිධ කාර්යයන් සදහා වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු විසින් පහත සදහන් පරිදි එකතුව රු.922,863,510 ක් වූ ප්‍රතිපාදන ලබා දි තිබුණු අතර ඒවා උපයෝජනය පිලිබඳ විස්තර පහත දැක්වේ.

විසර්ජන ශීර්ෂය	ප්‍රතිපාදන ලබා දුන් අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	ලබා දුන් ප්‍රතිපාදනය	තථ්‍ය වියදම	ඉතිරිය/අතිරික්තය (2010 දෙසැම්බර් 31 දිනට)
--------	--------------------	-----------	------------	-------------------
			රු	රු
101	බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය	1,250,000	1,250,000	නැත
105	ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය	230,245,134	223,793,775	6,451,358
106	ආපදා කළමනාකරණ අමාත්‍යාංශය	3,538,460	3,504,143	34,316
110	අධිකරණ අමාත්‍යාංශය	3,555,673	2,198,388	1,357,284
120	ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය	37,908,731	33,114,429	4,794,301
121	රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය	12,910,532	5,099,965	7,810,567
124	සමාජ සේවා අමාත්‍යාංශය	4,860,920	4,779,262	81,658
127	කම්කරු සබඳතා හා ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය	156,645	142,082	14,562
133	තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය	2,679,607	2,516,394	163,212
134	ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය	108,600	107,624	975
139	ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය	633,120	522,656	110,464

142	ජාතික උරුමයන් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	865,164	865,164	-
145	නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය	2,009,317	2,006,797	2,520
153	ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය	1,791,261	1,781,472	9,789
160	පරිසර අමාත්‍යාංශය	1,295.000	1,079,181	215,819
174	පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය	1,998,250	1,998,250	-
204	හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	330,000	330,000	-
206	සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	4,000	4,000	-
210	ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව	8,000	8,000	-
216	සමාජ සේවා දෙපාර්තමේන්තුව	935,380	931,192	4,187
217	පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව	1,754,538	1,642,235	112,302
218	සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව	322,468,703	318,809,774	3,658,928
219	ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව	15,446,994	15,127,261	319,733
226	ආගමන හා විගමන දෙපාර්තමේන්තුව	19,305	19,305	-
227	පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව	155,446	155,444	2

236	රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව	1,682,232	1,627,117	55,115
237	ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව	230,530	219,011	11,519
240	ජාතික අයවැය දෙපාර්තමේන්තුව	47,000	46,782	218
252	ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව	608,315	605,065	3,250
253	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	267,448,630	246,950,278	20,493,128
307	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව	6,155,785	5,808,242	347,543
		922,863,510	**876,809,449**	**46,054,061**

4.3 විගණනය හා විගණන විෂය පථය

මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ඇත. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

4.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා/ ගණන් දීමේ නිලධාරියාගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

4.5 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළිබඳ විගණන නිරීක්ෂණය

2010 දෙසැම්බර් 31 දනට මුල්‍ය වාර්තා හා පොත් අනුව මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ 4.6 සිට 4.11 දක්වා වූ ඡේදවල ඇතුලත් ප්‍රධාන විගණන නිරීක්ෂණ හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය වේ.

(අ) ගිණුම් ඉදිරිපත් කිරීම

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2011 මාර්තු 31 දින වන විට පහත සඳහන් ගිණුම් විගණනයට ඉදිරිපත් කර තිබුණි.

ශීර්ෂය/ විෂය අංකය	ගිණුමේ නම
269	විසර්ජන ගිණුම
26901	රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ශීර්ෂ 269-2-0-1202-11 යටතේ ඉන්ධන සඳහා වියදම රු.40,370 ක් විසර්ජන ගිණුමේ බැරකමක් ලෙස දක්වා තිබුණි. කෙසේ වුවද, මෙම වැය ශීර්ෂය යටතේ රු.288,523 ක ඉතිරි වීම් තිබුණි.

(ii) වැය ශීර්ෂ 269-0-1003-11 යටතේ නිවාඩු දුම්රිය බලපත්‍ර සඳහා වියදම් ගිණුම්ගත කිරීමේදී මන්මුනෙයි උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් බැරකම් රු.18,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(iii) පෙර වර්ෂයට අදාල රු.3,675 ක් වූ ඉන්ධන බිල් සමාලෝචිත වර්ෂය තුළදී නිරවුල් කර තිබුණි. කෙසේ වුවද, මන්මුනෙයි උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මෙම වියදම 2009 වර්ෂයේ බැරකමක් ලෙස දක්වා නොතිබුණි.

(iv) ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා රු.7,234,127 ක ප්‍රාග්ධන වියදම් සමාලෝචිත වර්ෂය තුළදී දරා තිබුණි. කෙසේ වුවද, ප්‍රාග්ධන වියදම් සඳහා යෝජනා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2010 වර්ෂය තුළදී පිළියෙල කර නොතිබුණි.

(v) ස්ථාවර වත්කම් ලෙස සැලකිය නොහැකි ග්ලාස් පෑඩ්ස් 70 ක රු.47,013 ක් වූ වටිනාකම ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතේ අයකර තිබුණි.

(ආ) පොදු තැන්පත් ගිණුම

2010 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.10,008,446 ක් වූ අතර, ඒ පිළිබඳ කාල විශ්ලේෂණයක් පහත දැක්වේ.

වර්ෂ 01 ට අඩු	වර්ෂ 01 ට වැඩි 02 අඩු	2010 දෙසැම්බර් 31 දිනට ශේෂය
රු.	රු.	රු.
5,406,608	4,601,838	10,008,446

(ඇ) අත්තිකාරම් ගිණුම්

රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

(i) හිඟ ණය ශේෂ

ඉදිරිපත් කරන ලද ගිණුම අනුව, 2010 දෙසැම්බර් 31 දිනට හිඟ හිට පැවති ශේෂ එකතුව රු.4,298,176 ක් විය. හිඟ හිටීමට හේතුව හා හිඟ හිට පැවති කාල පරිච්ඡේදය පිළිබඳ සටහනක් පහත දැක්වේ.

හේතුව		කාල විශ්ලේෂණය				
		වර්ෂ 1 ට වැඩි	වර්ෂ 1 ට වැඩි 2 ට අඩු	වර්ෂ 2 ට වැඩි 3 ට අඩු	වර්ෂ 3 ට වැඩි	එකතුව
		රු.	රු.	රු.	රු.	රු.
i.	ස්ථාන මාරු වීම්	279,478	423,126	998,629	1,401,522	3,102,755
ii.	විශ්‍රාම යාම්	122,756	201,520	-	31,749	356,025
iii.	සේවය අත්හැර යාම් හෝ වැඩ තහනම් කිරීම්	2,500	-	2,100	419,263	423,863
iv.	මියයාම් සහ ඉල්ලා අස්වීම්	285,200	82,738	-	47,595	415,533
		689,934	707,384	1,000,729	1,900,129	4,298,176

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

චලනය නොවන ණය ශේෂ 58 කට අදාලව රු.1,682,336 ක හිඟ ණය හා අත්තිකාරම් පැවති අතර, ශේෂ අයකර ගැනීම් පිළිබඳ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

4.6 අනුකූල නොවීම්

(අ) නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

නීති, රීති හා රෙගුලාසි වලට යොමුව	වටිනාකම	අනුකූල නොවීම
	රු.	
චක්‍රලේඛ විධිවිධාන		
2009 මාර්තු 24 දිනැති අංක 06/2008 (ii) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	8,820	2009 මාර්තු 24 දිනැති අංක 06/2008 (ii) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව 2011 ජනවාරි මාසය සඳහා රු.8,820 ක් වූ ඉන්ධන කාන්තන්කුඩි ප්‍රාදේශීය ලේකම් හට මූල්‍ය වර්ෂය ආරම්භ වීමට ප්‍රථම 2010 දෙසැම්බර් මාසයේදී ගෙවා තිබුණි. මේ සඳහා 2010 වර්ෂයේදී ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) **බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

මන්මුනෙයි දකුණ හා ඉරුවිල්පත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 153 වගන්තියට පටහැනිව සැපයුම්කරුවන්ට ගෙවන ලද රු.1,003,860 ක් වූ මුළු ගෙවීම්වලින් 5% ක රඳවා ගැනීම් බදු (WHT) අය කර නොතිබුණි.

4.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ පදිංචිය සඳහා රජයේ නිල නිවාස ඉදි කිරීමට 2007 සිට 2010 වර්ෂ තුළ රු.79,567,364 ක වියදම් දරා තිබුණි. කෙසේ වුවද, 2006 මාර්තු 21 දිනැති හා 2009 ජූනි 12 දිනැති අංක එච්ඒ/ඩීඒ/12/27 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා2009 ජූලි 01 දිනැති අංක බීටී/ඒඩී/සී/ඩීඑස්කිව්ආර්එස්/09 දරන දිස්ත්‍රික් ලේකම්ගේ ලිපියට අනුකූලව අදාල ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් මෙම නිල නිවාස පදිංචිය සඳහා යොදා ගෙන නොතිබුණි. මෙම නිල නිවාස වර්ෂ03 සිට 05 දක්වා කාල පරිච්ඡේදයක් නිෂ්කාර්යව පැවතුණි. ඉකුත් වර්ෂයේ මාගේ විගණන වාර්තාවෙන්ද මෙම කරුණ පිළිබඳව පෙන්වා දී ඇත.

4.8 අවිධිමත් ගනුදෙනු

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක් විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් ක්‍රියා පරිපාටියෙන් බැහැර වීම

(i) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මඩකලපුව

(අ) ප්‍රසම්පාදන කමිටු සහ තාක්ෂණ ඇගයීම් කමිටු රැස්වීම්වලට සහභාගි වීම වෙනුවෙන් සාමාජික දීමනා ලෙස එකතුව රු.70,250 ක් ගෙවා තිබුණි. මෙම රැස්වීම් සාමාන්‍ය කාර්යාල වේලාවෙන් බාහිරව සිදු කර නොතිබියදී හා අවම වශයෙන් රැස්වීම් දෙකකට හෝ සාමාජිකයන් සහභාගී වූ බවට සාක්ෂි නොතිබියදී මෙම ගෙවීම් 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 2.9.1 හා 2.9.2 වගන්ති හා 2007 ජූනි 28 දිනැති අංක 10 දරන එහි සංශෝධනයට පටහැනිව සිදු කර තිබුණි.

(ආ) රු.5,486,617 ක් වටිනා වත්කම් විෂයයන් 51 ක් පූර්ව අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගෙන තිබුණි.

(ii) මන්මුනෙයි පත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

මන්මුනෙයි පත්තු ප්‍රාදේශීය සභාව විසින් කොන්ක්‍රීට් මාර්ග වැඩ 21 ක් ප්‍රදේශයේ ග්‍රාම සංවර්ධන සමිති මාර්ගයෙන් ක්‍රියාත්මක කර තිබුණි. මෙම කොන්ත්‍රාත්තුවල මුළු වටිනාකම රු.20,580,000 ක් විය. වැඩ නිම කිරීම ප්‍රමාදයේදී ප්‍රමාණ කළ අලාභ අය කර ගැනීම සඳහා කොන්ත්‍රාත් ගිවිසුමට වගන්තියක් ඇතුළත් කිරීමට ප්‍රාදේශීය සභාවට නොහැකි වී තිබුණි. මෙම කොන්ත්‍රාත්කරුවන්ට කාලය දීර්ඝ කිරීමක්ද ලබා දී නොතිබුණි. ප්‍රාදේශීය සභාවේ කාර්මික නිලධාරී විසින් නිකුත් කරන ලද වැඩ නිම කිරීමේ සහතිකවලට අනුව දින 52 සිට දින 162 ක් දක්වා වූ කාලයක් වැඩ ප්‍රමාද කර තිබුණි. කෙසේ වුවද, ප්‍රමාණ කළ අලාභ අයකර ගැනීමෙන් තොරව ගෙවීම් සිදු කර තිබුණි. ප්‍රමාණ කළ අලාභ අයකර ගැනීම පිළිබඳ වගන්තියක් නොවූ බැවින් ඉක්ටාඩ් මාර්ගෝපදේශවලට අනුව දිනකට කොන්ත්‍රාත් වටිනාකමින් 1/4000 ලෙස එය ගණනය කළ යුතුය. ඒ අනුව රු.513,275 ක මුදලක් ප්‍රමාණ කළ අලාභ ලෙස කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකර ගත යුතු විය.

(iii) කෝරළෙයිපත්තු උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

ගම නැගුම වැඩසටහන යටතේ කාර්යයන් මාස 01 ක කාල ප්‍රමාදයකින් පසුව නිම කර තිබුණි. කොන්ත්‍රාත්කරුවන් වූ ග්‍රාම සංවර්ධන සමිති මූල්‍යමය වශයෙන් දුර්වල වූ අතර කාර්මික දැනුමෙන්ද හීන විය.

(iv) කෝරළෙයිපත්තු බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

ගම නැගුම වැඩසටහන යටතේ කාර්යයන් මාස 01 ක ප්‍රමාදයකින් පසුව නිම කර තිබුණි. කොන්ත්‍රාත්කරුවන් වූ ග්‍රාම සංවර්ධන සමිති මූල්‍යමය වශයෙන් දුර්වල බවත් කාර්මික දැනුමෙන් හීන වූ බවත් නිරීක්ෂණය විය. ගෙවීම් වවුචර්වලට අමුණා තිබූ වැඩ නිම කිරීමේ සහතිකවලට අනුව ඉතිරි වැඩ කොටස් දින දෙකක් තුළ නිම කර ඇති බවට දක්වා තිබුණද, එය ප්‍රායෝගික නොවූ හා සැක සහිත කරුණක් විය.

(v) මන්මුනෙයි දකුණ ඉරුවිල්පත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

(I) ප්‍රදේශීය ලේකම් කාර්යාලයේ ගබඩා භාරකරු විසින් කරන ලද ප්‍රකාශයට අනුව, ප්‍රාදේශීය ලේකම් විසින් ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය කිරීමෙන් තොරව ප්‍රසම්පාදන තීරණ 3 ක් අනුමත කර තිබුණි.

(II) ප්‍රාදේශීය ලේකම් විසින් 2010 ජූලි 23 හා 27 දින හා 2010 සැප්තැම්බර 23 දින ප්‍රසම්පාදන කමිටු රැස්වීම් තුනක් පවත්වා තිබුණු අතර, ප්‍රසම්පාදන රැස්වීම් සටහන්වල රැස්වීම් පවත්වන ලද වේලාව සටහන් කිරීමෙන් තොරව පවත්වා තිබුණි.

(ආ) අධිකාර බලය නොමැති වූ ගනුදෙනු

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඩකලපුව

2010 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදය සඳහා මඩකලපුව දිස්ත්‍රික් ලේකම්ගේ නිල නිවාසයෙහි පාටිච්චි කිරීම වෙනුවෙන් එල්පී ගෑස් නැවත පිරවීම සඳහා රු.20,562 ක වියදම් දරා තිබුණි. එවැනි වියදම් රජයේ අරමුදල්වලින් දැරීම සඳහා ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන නොමැත.

(ඇ) වෙනත්

(i) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මඩකලපුව

වටිනාකම රු.1,443,489 ක් වූ ලිපි ද්‍රව්‍ය 2010 වර්ෂයේදී මිලදී ගෙන තිබුණද, මිලදී ගැනීම් හා නිකුත් කිරීම් සටහන් කිරීම සඳහා විධිමත් තොග ලේඛන පවත්වා නොතිබුණි.

(ii) මන්මුනෙයි උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

(අ) 2010 ජනවාරි සිට දෙසැම්බර් දකවා වූ කාල පරිච්ඡේදය සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දිනපොත් උද්ධෘත හා දෛනික ධාවන වාර්තා අනුව, ගම නැගුම හා විමධ්‍යගත අයවැය කාර්යයන් පිළිබඳ අධීක්ෂණය සඳහා තථ්‍ය කාර්ය සාධනය කිලෝමීටර් 1252 ක් විය. එබැවින් 2010 ජූනි 09 දිනැති අංක බීටී/ඩීපීඑස්/ජීඑන්/ඒඑල්එල්ඕ/2010 දරන දිස්ත්‍රික් සැලසුම් ලේකම් කාර්යාලයේ ලිපියට අනුව ලීටර් 156.5 ක් සඳහා රු.11,503 ක් ප්‍රතිපූර්ණය කළ යුතු විය. එම නිසා, කිලෝ මීටර් 3,326 ක සඳහා ලීටර් 361.34 ක් වෙනුවෙන් රු.26,608 ක් ප්‍රතිපූර්ණය කර තිබූ බැවින් රු.15,105 ක වැඩිපුර ගෙවීමක් කර තිබුණි.

(ආ) 2010 ජනවාරි සිට මැයි දක්වා කාල පර්ච්ඡේදය වෙනුවෙන් මෝටර් වාහනයක ඉන්ධන හා අනෙකුත් නඩත්තු ගාස්තු සඳහා රු.192,391 ක් වූ වියදම් දරා තිබුණි. කෙසේ වුවද, මෙම කාල පරිච්ඡේදය සඳහා වූ දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුනි. එබැවින්, එම වියදම් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

(iii) කෝරළෙයිපත්තු බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

ප්‍රදේශයෙන් පිට ගමන් කිරීම සඳහා භාවිතා කළ අතිරේක ඉන්ධන වෙනුවෙන් රු.5,578 ක ඉන්ධන වියදම් ප්‍රතිපූර්ණය ලබා ගැනීමට දිස්ත්‍රික් ලේකම් විසින් අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව, අතිරේක ඉන්ධන සඳහා ගෙවීම් ප්‍රාදේශීය ලේකම් ලබාගෙන තිබුණි. කෙසේ වුවද, මෙම ප්‍රතිපූර්ණයන් සඳහා ඔහු විසින් කිසිදු බිලක් ඉදිරිපත් කර හෝ උපයෝජනය පිළිබඳ සාක්ෂි ලෙස ලබාගත් අතිරේක ඉන්ධන ප්‍රමාණය පිළිබඳ දෛනික ධාවන වාර්තාවල සටහන් කිරීමක් හෝ කර නොතිබුණි. දී තිබූ අනුමැතියට පටහැනිව මෙම ප්‍රතිපූර්ණයන් අතිරේක දීමනාවක් ලෙස සලකා තිබුණි.

(iv) මන්මුනෙයි පත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශයේ 2008 දෙසැම්බර් 22 දිනැති අංක 2009/01 දරන චක්‍රලේඛ විධිවිධානවලට අනුව "ළමුන්ට කිරි වීදුරුවක්" වැඩසටහන යටතේ ළමයින් අතර කිරි බෙදා හැරීම පිළිබඳව සැපයුම්කරු හා ප්‍රාදේශීය ලේකම් අතර, ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. දිනකට එක් ළමයෙකුට එක ලීටරයක් බැගින් මාසයකට දින 4 ක් පමණක් ග්‍රාම නිලධාරී කොට්ඨාශ 08 කිරි බෙදා හැර තිබූ බව නිරීක්ෂණය විය. ඒ අනුව, 2010 ජනවාරි සිට ජූලි දක්වා ළමයින් 3,421 දෙනෙකු සඳහා කිරි ලීටර් 13,684 ක් බෙදා හැර තිබුණි. එසේ වුවද, ලීටර් 17,105 ක් සඳහා ගෙවීම් කර තිබූ බැවින්, සැපයුම්කරුට රු.171,050 ක වැඩිපුර ගෙවීමක් කර තිබුණි. කෙසේ වුවද, මෙම වැඩිපුර ගෙවීමෙන් රු.31,900 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ආපසු අය කර ගෙන තිබුණි.

4.9 වංචනික ස්වරූපයේ ගනුදෙනු

මන්මුනෙයිපත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

ගමනැගුම ජීවනෝපාය වැඩසටහන යටතේ ප්‍රතිලාභීන්ට ගම් කුකුළු පැටවුන් වෙනුවට ෆාම් කුකුළු පැටවුන් 39% ක් සපයා තිබුණි. මේ අනුව ෆාම් කුකුළු පැටවුන් 429 ක් මේ ආකාරයට සපයා තිබුණි. කුකුළු පැටවුන් 429 සඳහා වංචනික ගෙවීම රු.55,770 ක් විය. ප්‍රතිලාභීන් විධිමත් පරිදි ප්‍රතිලාභ ලබා නොතිබුණි.

4.10 මෝටර් වාහන උපයෝජනය

(i) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මඩකලපුව

මෝටර් වාහන කිහිපයක පාලනය හා අධීක්ෂණය සඳහා ලේඛනයක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පවත්වා නොතිබුණි. එම මෝටර් වාහනවල මාසික කාර්ය සාධන වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. වෙන් කරන ලද මෝටර් වාහන සඳහා 2010 ජනවාරි සිට මැයි දක්වා වූ දෛනික ධාවන වාර්තාද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ඒ අනුව, නිලධාරීන් තුන් දෙනෙකුට ගෙවන ලද රු.127,449 ක් වූ ඉන්ධන දීමනා සහ රු.35,427 ක් වූ දරන ලද අතිරේක ඉන්ධන වියදම්ද විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

(ii) කෝරලෙයිපත්තු මධ්‍යම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

අංක 251-3527 දරන මෝටර් වාහනය සඳහා මිලදී ගනු ලැබූ රු.7,890 ක් පිරිවැය වූ ඉන්ධන ලීටර් 107.50 ක දෛනික ධාවන සටහන්වල ඇතුළත් කර නොතිබුණි.

4.19 මානව සම්පත් කළමනාකරණය

අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු

2010 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල තත්ත්වය පහත පරිද විය.

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
(i) ජ්‍යෙෂ්ඨ මට්ටම	63	47	16
(ii) තෘතියික මට්ටම	42	15	27
(iii) ද්විතියික මට්ටම	326	266	60
(iv) ප්‍රාථමික මට්ටම	138	115	23
එකතුව	569	443	126